# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/23 - 2022 ජූලි මස 20 වැනි බදාදා - 2022.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන තංගල්ල ප්‍රාදේශීය සභාවේ තෝරාඒවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ තෝරාඒවා ඇති සභිකයෙකු ලෙස පත්වූ සායක්කාරගේ කිත්සිරි අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම තංගල්ල ප්‍රාදේශීය සභාවට තෝරාඒවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ආරියචන්‍ද්‍රගේ කොඩිතුවක්කු චානක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

තංගල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥ පනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ආරියචන්ද්‍රගේ කොඩිතුවක්කු චානක, තංගල්ල ප්‍රාදේශීය සභාවට තෝරාඒවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ,**
තේරීම්භාර නිලධාරි,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2022 ජූලි මස 18 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

EOG 07 - 0108

1A - G37104 — 16 (2022/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*